# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2473/06 – 2026 ජනවාරි මස 26 වැනි සඳුදා – 2026.01.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 496/ඒ - මීගහවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මීගහවැව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක PU/NTT/2024/208 හා 2024.12.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර A – තල්ගහවත්ත, මීගහවත්ත, දොරකඩවත්ත, මාදංගහවත්ත, විලකුඹුර, පිල්ලැව, මකුල්ලගහ කුඹුර සහ මාදංගහවත්ත - ප්‍රමාණය: හෙක්. 0.0370**

උතුරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි විලකුඹුර; නැගෙනහිරට: හිමිකම් කියන්නා සොයාගත නොහැකි විලකුඹුර; දකුණට: නිලූකා දමයන්ති හිමිකම් කියන තල්ගහවත්ත, මීගහවත්ත සහ එම්. සුරේෂ් සංජීව හිමිකම් කියන තල්ගහවත්ත, මීගහවත්ත; බටහිරට: එම්. සුරේෂ් සංජීව හිමිකම් කියන තල්ගහවත්ත, මීගහවත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/13/2024/HA/04.
2025 දෙසැම්බර් මස 19 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0266.




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඬුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1362, ගල්ලැහැපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිරිවනාගාර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක KU/PDE/2023/236 හා 2023.09.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර A – බණ්ඩාරවත්ත - ප්‍රමාණය: හෙක්. 0.0135ක් පමණ**

උතුරට: වන්න දාස්වත්ත හිමිකම් කියන බණ්ඩාරවත්ත; නැගෙනහිරට: කේ.එම්. නිමල් ප්‍රියදර්ශන හිමිකම් කියන බණ්ඩාරවත්ත; දකුණට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට: වන්න දාස්වත්ත හිමිකම් කියන බණ්ඩාරවත්ත.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2023/PT/01.
2025 නොවැම්බර් මස 21 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0268.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.